# 2.46 නූතන ආදිවාසී කාන්තාව හා අවතරණ පිළිවෙත්
## (දඹාන වැදි ගම්මානය ඇසුරින් )

කුමුදු සුමේධා, උදේනි හේරත්, මධූෂා සමරකෝන්, තිලිණි දයානන්ද, ශාන්ති අබේසිංහ
සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

---

## ABSTRACT

ලෝකයේ මෙතෙක් මද වශයෙන් හෝ ශේෂවී ඇති ආදිවාසී සංස්කෘතීන් අතරින් ලංකාවේ වැදි ජනයාට හිමිවන්නේ සුවිශේෂී වැදගත්කමකි. මෙම සුවිශේෂී ජනවර්ගය සම්බන්ධයෙන් විශිෂ්ඨ ගණයේ පර්යේෂකයින් (Seligman:1911, Spittle:1950, Wijesekara:1964, Dharmadasa:1938, Rathnapala: 2003) විසින් අධ්‍යයනයන් සිදුකර ඇත. මෙම අධ්‍යයනයන් පිරික්සීමේදී ලංකාවේ වැදි ජනයාගේ ආරම්භය, විකාශය හා වර්ධනය පිළිබඳ මානව විද්‍යාත්මක තොරතුරු බහුලය. එවන් පසුබිමක් තුළ වැදි කාන්තාව සුවිශේෂී කොටගත් ඔවුන්ගේ ජීවිතය හා සම්බන්ධ උපත, වැඩිවිය පත්වීම, විවාහය හා මරණය සම්බන්ධ අවතරණ පිළිවෙත් අධ්‍යයනය මෙහි ප්‍රධාන අරමුණයි.

නූතන සමාජ වෙනස්වීමත් සමග සීග්‍ර සමාජ වෙනසකට ලක්ව ඇති, වැදිජනයාගේ නිජබිම වන් දඹාන ආදිවාසී ගම්මානය අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරාගෙන ඇති අතර එහි ආදිවාසී කාන්තාවන් 25 දෙනෙකුගෙන් යුත් අහඹු නියැදියක් පාදක කර ගනිමින් අධ්‍යයනය සිදුකර ඇත. මෙම අධ්‍යයනයේ දී සාම්ප්‍රදායික හා නූතන අවතරණ වත් පිළිවෙත් සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීම සඳහා සන්සන්දනාත්මක පර්යේෂණ ක්‍රමයත්, එම තොරතුරු තහවුරු කරගැනීම සඳහා සිද්ධි අධ්‍යයන ක්‍රමයත් යොදාගෙන ඇත. දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම ලෙස ආකෘතික සම්මුඛ සාකච්ඡා, විද්‍යාත්මක නිරීක්ෂණ, ඉලක්කගත පුද්ගල සාකච්ඡා (Key Informatics Discussions) යොදාගැනුණි.

නූතන සමාජ වෙනස්වීමට සාපේක්ෂව කාන්තාවගේ අවතරණ පිළිවෙත් හා සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍රයන්ගේ ස්වරූපය සැලකිය යුතු මට්ටමකින් වෙනසකට භාජනය වී ඇතත් යම් යම් සාම්ප්‍රදායික අංගයන් තවමත් භාවිතයේ පවතින බව අධ්‍යයනයේදී තහවුරු විය. විශේෂයෙන්ම නූතන ආදිවාසී කාන්තාව සමාජ වෙනස්වීමේ ක්‍රියාවලියට සමගාමීව ආකල්පමය වශයෙන් පරිවර්තනීය සමාජ අවධියක පසුවන බවත් මෙහිලා දැක්විය හැකිය. වර්තමානය වන විට දඹාන ආදිවාසීන්ටම ආවේනික වූ යම් සංස්කෘතික අංග ආරක්ෂා වී ඇත්නම් එය වැඩිහිටියන්ගේ පෙළඹවීම මත හා වානිජ්‍ය පරමාර්ථ මත සිදු වන්නක් බව කිව යුතුමය.

**මුඛ්‍ය පදඃ** සමාජ වෙනස්වීම් කාරක, අවතරණ පිළිවෙත්, ආදිවාසී කාන්තාව